(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 219.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 ඔක්තෝබර් මස 25 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1887/'11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, අල්ගොඩ, මල්වරුෂා තිඹිරිපොල පිරිවෙන පාරෙහි පිහිටි නිවාස සඳහා සපයනු ලබන ජලය ප්‍රමාණවත් නොවීමෙන් එම ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය සඳහා බලපා ඇති හේතු කවරේද;

(ii) බලපා ඇති එම ගැටලු මඟහරවා කඩිනමින් ජල සැපයුම යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/'11

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්තමානයේ අවිධිමත් හා අනියම් ක්‍රම මඟින් කාන්තාවන් හා කුඩා ළමුන් ගෘහ සේවය, ළමුන් රැක බලාගැනීම හා ගෙවතු නඩත්තුව ආදී රැකියා සඳහා යොදවන බවත්;

(ii) එසේ සේවයේ යෙදෙන කුඩා ළමුන් හා කාන්තාවන් බොහෝවිට නොයෙකුත් වද හිංසාවලට භාජනය වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි ළමුන් සහ කාන්තාවන් වද හිංසාවලට ලක්වීම තුරන් කිරීම සඳහාත්, සේවක හා සේව්‍ය යන දෙපාර්ශ්වයටම යහපතක් වීම සඳහාත්, ඉහත සඳහන් රැකියා අපේක්ෂිත අයට ලියාපදිංචි විය හැකි විධිමත් ක්‍රමවේදයක් සහිත ආයතනයක් පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) පිහිටුවන ලද එවැනි ආයතනයක ලියාපදිංචි පුද්ගලයින් පමණක් ඉහත (අ) (i) හි සඳහන් රැකියා සඳහා විධිමත්ව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2151/’11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේදී වීරවිල ගුවන් තොටුපලට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වන විට මුද්‍රණයකර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) එම ලොතරැයිය පවත්වාගෙන යාම සඳහා ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම වෙත ලොතරැයි මණ්ඩලය විසින් ගෙවන ලද බදු හෝ කුලී ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) මෙම ටිකට්පත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට සපුරාගෙන තිබේද;

(ix) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2199/’11

4.

ගරු රවී කරුණානායක මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ හතරක කාලය තුළ, එක් එක් වර්ෂයේදී සී/ස මිල්කෝ පුද්ගලික සමාගම,

(i) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව; එක් සේවකයකුගෙන් ලැබූ ලාභය සහ එක් සේවකයකු සඳහා දරන ලද පිරිවැය කොපමණද;

(iii) රජයට ගෙවූ තීරුබදු සහ බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සී/ස මිල්කෝ සමාගම තුළ මේ දක්වා යොදවන ලද ගෙවා නිමි ප්‍රාග්ධන සහ සංචිත කවරේද;

(ii) එම ආයතනයට ලබා දෙන පොහොර සහනාධාරය සඳහා කරන ලද වියදම් රජය විසින් ප්‍රතිපූරණය කර ගන්නා ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2527/'12

5\.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සපිරි පාසල් ව්‍යාපෘතිය සඳහා 2012 ජනවාරි 31 වනවිට තෝරා ගෙන තිබූ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂයේදී වැයකිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) දැනට එම මුදල් ප්‍රතිපාදන ලැබී ඇති ආකාරය කවරේද;

(iv) 2012 වර්ෂයේ පළමු කාර්තුව තුළ සපිරි පාසල් ලෙස තෝරාගත් එක් එක් පාසල සඳහා ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2548/'12

6\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

2781/'12

7\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012.05.01 දින යාපනයේ පැවති ඒකාබද්ධ විපක්ෂයේ මැයි රැළියේදී කොටි සංවිධානයට අයත් කොඩියක් යම් අයෙකු විසින් ප්‍රදර්ශනය කරන රූපරාමු ඇතුළත් ප්‍රවෘත්තියක් ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශය කළේද;

(ii) ස්වාධීන රූපවාහිනී සේවයට අයත් මාධ්‍යකරුවෙක් හෝ කණ්ඩායමක් විසින් එකී මැයි රැළිය රූගත කරනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, කොටි සංවිධානයට අයත් කොඩියක් ප්‍රදර්ශනය කිරීමේ දර්ශන ඇතුළත් වීඩියෝ පටය ස්වාධීන රූපවාහිනී සේවයට ලබා දුන් පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්වාධීන රූපවාහිනී සේවය විසින්,

(i) ඉහත වීඩියෝ පටයේ අව්‍යාජභාවය හෝ නිරවද්‍යභාවය තහවුරු කරගනු ලැබූ ආකාරය කවරේද;

(ii) ඉහත කී දර්ශන ඇතුළත් රූපරාමු විකාශය කරන ලද වාර ගණන කොපමණද;

(iii) එම දර්ශන විකාශය කරන ලද දින හා වේලාවන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1888/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දික්වැල්ල කුමාරතුංග ජන කෞතුකාගාරය වෙනුවෙන් ඉදිකළ ගොඩනැගිල්ල මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(ii) එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියකින් සිදුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2152/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 නොවැම්බර් මස 25 වැනි දින පැවති ශ්‍රීපාදස්ථානාධිපති ස්වාමින්වහන්සේ තේරීමේ ඡන්ද විමසුම සඳහා ඉදිරිපත් වූ භික්ෂූන්වහන්සේලාගේ නම් කවරේද;

(ii) එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය තිබූ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගිහියන්ට අවස්ථාව ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඡන්දහිමි භික්ෂූන්වහන්සේලා පැහැර ගැනීමක් හෝ ඡන්දපොලට පැමිණෙන භික්ෂූන්වහන්සේලාට බාධා කිරීමක් හෝ සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඊට මැදිහත්වූ පිරිස හඳුනාගෙන තිබේද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ඡන්ද විමසීමට අදාළව රජයේ අමාත්‍යවරුන්ට සහ මහජන නියෝජිතයින්ට යම් කාර්ය භාරයක් පවරා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආනන්තරීය පාපකර්මයක් වන සංඝ භේදයට හේතුවන සිදුවීම් එකී කාල සීමාවේ දී සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී එවැන්නක් සිදු නොවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2200/'11

10.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2230/'12

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 - 2010 අතර කාල වකවානුව තුළ රට තුළ වසා දැමූ රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) පාසල් වසාදැමීමට ප්‍රධානතම හේතුව ප්‍රමාණවත් සම්පත් නොලැබීම බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, එම පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2529/'12

12.

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීමේ ව්‍යාපෘතියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එම පරිගණක ලබාදීම සඳහා සිසුන් තෝරා ගැනීමේ නිර්ණායක කවරේද;

(iii) මේ වනවිට ලැප්ටොප් පරිගණක ලබාදී ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) අනෙකුත් විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගණක ලබාදීමට කොපමණ කාලයක් ගතවේද;

(v) ඒ සඳහා වැයවෙතැයි අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(vi) එම මුදල් සොයා ගැනීම සඳහා සකස් කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2554/'12

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 මැයි 30 දිනෙන් පසුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ගුවන් යානා මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, මිලදීගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව එක් එක් වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත මිලදීගැනීම්වලදී ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් කවරේද;

(v) එම එක් එක් සමාගම විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(vi) ගුවන් යානා මිලදී ගැනීම සඳහා අදාළ ආයතන තෝරාගත් පදනම කවරේද;

(vii) එම ගුවන් යානා මිලදී ගැනීමට වැය කරන ලද මුළු මුදල කොපමණද;

(viii) එවැනි ගුවන් යානා සංඛ්‍යාවක් මිලදී ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2853/'12

14.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉන්දියාවේ, තමිල්නාඩු ප්‍රාන්තයේ, කන්‍යාකුමාරි දිස්ත්‍රික්කයේ, කුඩන්කුලම් න්‍යෂ්ටික විදුලි බලාගාරය (Kudankulam Nuclear Power Plant) නම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම න්‍යෂ්ටික විදුලි බලාගාරයේ ධාරිතාවය කොපමණද;

(ii) එහි සිට ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවට ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iii) එය පිහිටි ස්ථානයේ සිට ශ්‍රී ලංකාවට ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iv) එහි ස්ථාන තක්සේරු වාර්තාව (Site Evaluation Study Report) ශ්‍රී ලංකා රජයට ලැබී තිබේද;

(v) එහි ආරක්ෂක විශ්ලේෂණ වාර්තාව (Safety Analysis Report) ශ්‍රී ලංකා රජයට ලැබී තිබේද;

(vi) ඉහත වාර්තා සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් විදුලි බලාගාරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පරිසරයට සිදුවිය හැකි බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා රජය මේ වන විට සිදුකර ඇති අධ්‍යයනයන් කවරේද;

(ii) එම අධ්‍යයනයන්හි වාර්තා සභාගත කරන්නේද;

(iii) ඉහත කී න්‍යෂ්ටික විදුලි බලාගාරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පරිසරයට සිදුවන හානි වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2232/'12

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත තුළින් අද ගොවියාගේ අද අයිතිය ආරක්ෂා වීම අපේක්ෂා කළමුත් මේ වනවිටත් අද අයිතිය අහිමි කරන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා, 10 වැනි සෙනසුරාදා, 12 වැනි සඳුදා, 14 වැනි බදාදා, 15 වැනි බ්‍රහස්පතින්දා, 16 වැනි සිකුරාදා සහ 17 වැනි සෙනසුරාදා "විසර්ජන පනත් කෙටුම්පත (2013)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2013)" සලකා බැලීම සඳහා 2012 නොවැම්බර් මස 09 වැනි දින සිට නොවැම්බර් මස 16 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.00ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2013)" සලකා බැලීම සඳහා 2012 නොවැම්බර් මස 17 වැනි සෙනසුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.00 දක්වා විය යුතු ය. අ. භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2012 නොවැම්බර් මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

6.

ගරු තිස්ස අත්තනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සිරිලක ප්‍රජා ශාන්ති පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

7.

ගරු හුනෛයිස් ෆාරුක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්. ඒ. එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 වැනි දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු.48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

දිවිනැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්ති යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදි.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.02.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.04.05 දින සලකා බලන ලදි.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදි.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2009.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදී.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2010,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2012.06.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදී.)

*12.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

16.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**